# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1546/7 - 2008 අප්‍රේල් 22 වැනි අඟහරුවාදා - 2008.04.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත**

5 වන වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන ) පනතේ 5 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ පනවන ලද 2006 ඔක්තෝබර් 05 දිනැති සහ අංක 1465/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝග පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

රංජිත් සියඹලාපිටිය,
වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2008 ක් වූ අප්‍රේල් මස 11 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

1. එම උපලේඛනයේ 13 වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමෙන් :—

"13. ගුවන් ගමනාගමන පනත ( 365 අධිකාරය ) යටතේ ලියාපදිංචි කරන ලද යම් ගුවන් යානයක් හෝ 1971 අංක 52 දරන වෙළෙඳ නාවික පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් නැවක් සම්බන්ධයෙන් වන උකස් හෝ කල්බදු ඔප්පුවක්."

05 - 77

1A - G 009659— 2430 (2008/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.